ISBN 978-955-7544-09-0
E-ISBN 978-624-5747-21-4

# සිංහල ග්‍රන්ථනාම සාධිකාරි ලේඛනය

## (සමාරම්භයේ සිට 1850 තෙක්)

NATIONAL LIBRARY OF SRI LANKA
N L S L
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# සිංහල ග්‍රන්ථනාම සාධිකාරී ලේඛනය

## (සමාරම්භයේ සිට 1850 තෙක්)

# සිංහල ග්‍රන්ථනාම සාධිකාරි ලේඛනය

## (සමාරම්භයේ සිට 1850 තෙක්)

NATIONAL LIBRARY OF SRI LANKA
NLSL

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

සිංහල ග්‍රන්ථනාම සාධිකාරී ලේඛනය : (සමාරම්භයේ සිට 1850 තෙක්)
© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 2026

ISBN 978-955-7544-09-0
E-ISBN 978-624-5747-21-4

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

සිංහල ග්‍රන්ථනාම සාධිකාරී ලේඛනය : (සමාරම්භයේ සිට 1850 තෙක්).-
සංශෝධිත සංස්කරණය.- කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන
සේවා මණ්ඩලය, 2026.
පි. xii, 39 ; සෙමී. 26
ISBN 978-955-7544-09-0
E-ISBN 978-624-5747-21-4

i. 025.3222 (ඩිවි 23) ii. ග්‍රන්ථනාමය

1. පුස්තකාල විද්‍යාව
2. සාධිකාරී පාලනය - ග්‍රන්ථනාම

**සම්පාදන උපදේශකත්වය**
ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ - සභාපති
ඩබ්ලිව්. සුනිල් - අධ්‍යක්ෂ ජනරාල්
ආචාර්ය පද්මා බණ්ඩාරනායක - අධ්‍යක්ෂ

**සම්පාදනය**
මහාචාර්ය රත්නසිරි අරංගල
උදිත අලහකෝන්

**සම්පාදන සහාය**
අනෝමා විජේසිංහ
මෛත්‍රී ජයසුන්දර
කමලාංගනී සුබසිංහ
උපුල් ජයන්ත
චන්දන සෙනෙවිරත්න
රුවන්ති නිල්මිණි

**පිටු සැකසුම**
තනුජා රංගිකා

**ප්‍රකාශක**
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,
අංක 14, නිදහස් මාවත,
කොළඹ 07.

දුරකථන අංක : 011 2685195, 011 2698847
විද්‍යුත් තැපැල : biblio@mail.natlib.lk
වෙබ් අඩවිය : https://www.natlib.lk

# පටුන


| | |
|---|---|
| | පිටු |
| පෙරවදන | vii-viii |
| භාවිතය පිළිබඳ උපදෙස් | ix |
| කෙටි යෙදුම් | xi |
| ග්‍රන්ථනාම සාධිකාරි ගොනුව | 1-35 |
| ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය | 37 |
| ග්‍රන්ථනාම සාධිකාරි ලේඛනය - සම්පාදක කමිටුව | 39 |

# පෙරවදන

සිංහල ග්‍රන්ථනාම සාධිකාරි ලේඛනය කෘතිය ප්‍රථම වරට ප්‍රකාශයට පමුණුවන ලද්දේ 2007 වර්ෂයේදීය. එම කෘතියට ඇතුළත් කරන ලද ග්‍රන්ථනාමවල සදොස් තැන් නිදොස් කර මග හැරුණු සහ අදාළ කාල සීමාවට පෙර හා පසු ප්‍රකාශයට පත් වූ ග්‍රන්ථනාම ඇතුළත් කිරීමේ අරමුණින් 2008 වර්ෂයේ තොරතුරු රැස් කිරීම ආරම්භ කරන ලදි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණය ආරම්භ වූ මුල් වකවානුවේ සිට 1850 තෙක් පළ වූ කෘතිවල නාම ඇතුළත් කිරීමට හැකි විය. මුල් කෘතියට ඇතුළත් වූ නමුත් භාවිතයේ නොමැති ග්‍රන්ථ ඉවත් කර ග්‍රන්ථනාම තොරතුරු ඇතුල් කිරීමේ ආකෘතිය ද වෙනස් කර මෙම සංස්කරණය සම්පාදනය කරන ලදි. මීට පෙර තිබූ පාලි හා සංස්කෘත පොත් ද ඉවත් කිරීමට කටයුතු කරන ලදි.

සිංහල ග්‍රන්ථනාම සාධිකාරි ලේඛනය, සූචිකරණ කටයුතුවල දී ග්‍රන්ථනාමවල ඒකමිතික බවක් ඇති කර ගැනීමට අමතරව ලේඛන පිළිබඳ ඉතිහාසගත තොරතුරු ලබා ගත හැකි ශාස්ත්‍රීය මූලාශ්‍රයක් ලෙස ද අගය කළ හැකිය.

මෙම කෘතියට ඇතුළත් කරන ලද ග්‍රන්ථවල සම්පාදිත කාලය සඳහන් කර ඇති අතර වෙනත් මූලාශ්‍ර හරහා ලබා ගත් තොරතුරු මත කාලය සඳහන් කිරීමේ දී ඒවා කොටු වරහන් තුළ දක්වා ඇත. සියලුම ග්‍රන්ථනාම අතුරින් ප්‍රචලිත නාමය ඒකීය ග්‍රන්ථනාමය ලෙස භාවිත කිරීමට එම නාමය අකාරාදි අනුක්‍රමයෙන් පෙළ ගස්වා අනිකුත් නාම ඇතුළත් කර තිබේ. අදාළ ග්‍රන්ථ සඳහා කර්තෘ දැක්වීමේ දී කර්තෘ නාම සාධිකාරි ලේඛනයේ කර්තෘ නාමය දක්වා ඇති ආකාරය අනුගමනය කර ඇති අතර පාඨකයන්ගේ අවබෝධය පිණිස ග්‍රන්ථ නාමය යටතේ අදාළ කෘතිය පිළිබඳ කෙටි විස්තරයක් ඇතුළත් කර කර්තෘ සහ මුල් වරට පළ වූ යුගය සඳහන් කර ඇත.

පළමු සංස්කරණය සඳහා පත් කළ උපදේශක කමිටුවේ සභාපතිධුරය ඉසිලූ මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස මහතා මෙම සංස්කරණයේ කටයුතු සඳහා ද 2012 වර්ෂය තෙක් දායකත්වය ලබා දුන් අතර අනතුරුව මහාචාර්ය රත්නසිරි අරංගල මහතා උපදේශක කමිටු සභාපතිත්වයට පත් විය. මෙම කෘතියට නිවැරදි තොරතුරු ඇතුළත් කිරීම සඳහා කැපවීමෙන් ක්‍රියා කළ මහාචාර්ය රත්නසිරි අරංගල මහතාගේ දායකත්වය අතිශයින් අගය කරමි. සූචිකරණ නීතිවලට අනුකූලව ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු මෙම කෘතියට අතුළත් කිරීමට උදිත අලහකෝන් මහතා දැක්වූ දායකත්වය ද අගය කළ යුතුය.

උපදේශක කමිටුව විසින් නිවැරදි ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු තහවුරු කර ගැනීම සඳහා ජේම්ස් ද අල්විස් සූචිය, ලුවි ද සොයිසා සූචිය, මලල්ගොඩ එකතුව, ජී. එස්. බී. සේනානායක එකතුව හා කළුකොඳයාවේ පඤ්ඤාසේකර හිමි එකතුව පරික්ෂා කරන ලදි.

උපදේශක කමිටුවේ මූලිකත්වයෙන් සම්පාදනය කළ පිටපත තවදුරටත් නිවැරදිකර ගැනීම සඳහා මහාචාර්ය සිරි තිලකසිරි මහතා වෙත යොමු කළ අතර ඔහු විසින් ලබාදුන් උපදෙස් අනුව සංශෝධන සිදු කරන ලදි. මහාචාර්ය සිරි තිලකසිරි මහතාට සහ සම්පාදන කාර්යය සඳහා සහාය වූ පූජ්‍ය වස්කඩුවේ සිරි සරණ හිමියන්ට ද කෘතවේදිත්වය පළ කරමි.

දත්ත හා තොරතුරු රැස්කර ගැනීමට පහසුකම් ලබාදුන් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, සිංහල ශබ්දකෝෂ කාර්යාලය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, රාජකීය ආසියාතික සංගමය, ඇතුලු ආයතනවල ප්‍රධානීන් සහ පුස්තකාල භාර පුස්තකාලයාධිපතිවරු ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට ද ස්තුතිය පුද කරමි.

සිංහල ග්‍රන්ථනාම සාධිකාරි ලේඛනය කෘතිය සම්පාදනය සඳහා උපදෙස් හා සහාය ලබාදුන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ හිටපු සභාපති ආචාර්ය ඩබ්ලියු. ඒ. අබේසිංහ මහතාට ද හිටපු අධ්‍යක්ෂ ජනරාල් එම්. එස්. යූ. අමරසිරි මහතාට ද සියලුම කමිටු සාමාජික භවතුන්ට ද තොරතුරු රැස්කිරීමෙන් සහාය ලබාදුන් පී. ජයසේකර හා ඒ. එන්. ප්‍රේමතිලක යන මහත්ම මහත්මීන්ට ද ස්තුතිය පුද කරමි. අවසාන වශයෙන් මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා කටයුතු කළ අධ්‍යක්ෂ

ආචාර්ය පද්මා බණ්ඩාරනායක මහත්මියට, ග්‍රන්ථ විඥාපන පාලන අංශයේ හිටපු අංශ ප්‍රධානවරුන් වන අමරා නානායක්කාර මහත්මියට, චන්දිමා වාදසිංහ මහත්මියට, අනෝමා විජේසිංහ මහත්මියට සහ කමලාංගනී සුභසිංහ මහත්මියට මෙන්ම අනෙකුත් නිලධාරීන් වන චන්දන සෙනවිරත්න මහතාට, උපුල් ජයන්ත මහතාට, රුවන්ති නිල්මිණි මහත්මියට, ග්‍රන්ථ විඥාපන පාලන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මෛත්‍රී ජයසුන්දර මහතාට සහ අංශයේ සියලු කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙමි.

මෙහි අඩුපාඩු ඇතොත් ඉදිරි සංස්කරණයක දී නිවැරදි කිරීමට අප වෙත දන්වා එවන්නේ නම් අතිශයින් කෘතඥ වෙමි.

ඩබ්ලිව්. සුනිල්
අධ්‍යක්ෂ ජනරාල්

ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ
සභාපති

# භාවිතය පිළිබඳ උපදෙස්

මෙහි එන සියලු ම ග්‍රන්ථනාම ආකාරාදීව අනුක්‍රමයෙන් පෙළගස්වා ඇත. තද කළු අකුරින් මුද්‍රිත සියලු ම ග්‍රන්ථනාම කිසියම් කෘතියක් විවිධ ග්‍රන්ථනාමවලින් හැඳින්වෙන අවස්ථාවලදී සූචිකරණ අරමුණු සඳහා හඳුනා ගැනීම පිණිස භාවිත කළ යුතු ග්‍රන්ථනාමය වේ. සාමාන්‍ය අකුරින් මුද්‍රිත ග්‍රන්ථනාම, භාවිතයට නොගන්නා ග්‍රන්ථනාමයි. එම ග්‍රන්ථනාම තද කළු අකුරින් දක්වා ඇති ග්‍රන්ථනාමය යටතේ ආකාරාදිව පෙළගස්වා ඇත.
ඒ අනුව ග්‍රන්ථයක් විවිධ නම්වලින් හැඳින්වෙන අවස්ථාවල දී එකී විවිධ නාම තද කළු අකුරින් දක්වා ඇති ඒකීය ග්‍රන්ථනාමය යටතේ අකාරාදිව පෙළගස්වා ඇත..

උදා : **අභිධර්මාර්ථ සංග්‍රහ සන්‍යය**
**අමාවතුර**
**අඹ විදමන**

ග්‍රන්ථ සූචිකරණය කිරීමේ දී තවමත් බොහෝ පුස්තකාලවල භාවිත කරනු ලබන්නේ ඇන්ග්ලෝ ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහයේ දෙවන සංශෝධිත සංස්කරණයයි (AACR 2 R 2002). ඒ අනුව බොහෝමයක් ආගමික ග්‍රන්ථ ඇතුළු පැරණි සාහිත්‍ය ග්‍රන්ථ සූචිකරණය කිරීමේ දී ඒකීය ග්‍රන්ථනාමය (Uniform title) භාවිත කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. පාඨකයන්ගේ අවබෝධය පිණිස ග්‍රන්ථ නාමය යටතේ අදාළ කෘතිය පිළිබඳ කෙටි විස්තරයක් ඇතුළත් කර කර්තෘ සහ මුල් වරට පළ වූ යුගය සඳහන් කර ග්‍රන්ථනාමය ඉංග්‍රීසි භාෂාවෙන් උච්චාරණය වන ආකාරය සඳහන් කර ඇත.

උදා : **උම්මග්ග ජාතකය**
*Ummagga Jātakaya*
--- : කුරුණෑගල

ප්‍රඥා පාරමිතාවේ අගය පෙන්වන ජාතක කතාවකි. අට ජාතක දස ජාතකයන්ට අයත් වේ.

- උම්මග්ග ජාතකය
- උම්මග්ග ජාතකය (කේවට්ට කුමන්ත්‍රණයේ පටන් අවසානයට)
- උම්මග්ග ජාතකය : ගැටපද සහිතයි
- උම්මග්ග ජාතකය : පරිකන්ද කතාවේ අග සිට අවසානය දක්වා

## කෙටි යෙදුම්

| | |
|---|---|
| ක්‍රි.ව. | ක්‍රිස්තු වර්ෂ |
| සම්පා. | සම්පාදනය |
| සංස්. | සංස්කරණය |
| සංශෝ. | සංශෝධනය |
| ශෝ. | ශෝධක |

# ග්‍රන්ථ නාමාවලිය

## අට දා සන්නය

*Aṭa Dā Sannaya*

—— : දඹදෙණිය

ජාතක අටුවාවේ අග කොටසේ ඇති තේමිය, මහා ජනක, සාම, නිමි, ඛණ්ඩහාල, භූරිදත්ත, මහා නාරද කාශ්‍යප සහ විධුර යන ජාතකයන්ට සිංහලෙන් කළ විස්තර සන්නයකි.

- අට දා සන්නය
- අට දා සන්නයේ තේමිය ජාතක සන්නය
- අට දා සන්‍යය
  අට දා සන්නයඃ අට දා සන්නයේ තේමිය ජාතක සන්නය

## අන්ධභූත ජාතක කාව්‍යය (කව්සිළුමිණ II)

*Andhabhūta Jātaka Kāvyaya*

ධම්මක්ඛන්ධ හිමි, තල්අරඹේ : මහනුවර

අන්ධභූත ජාතකය ඇසුරු කොට සිව්පද ආකෘතියෙන් කළ පද්‍ය 124කින් යුත් කෘතියකි. දෙවන කව්සිළුමිණ යන අපර නාමයකින් ද හැඳින්වේ.

## අනාගත වංශය හෙවත් මෙතේ බුදු සිරිත

*Anāgata Vaṅśaya Hevat Metē Budu Sirita*

සංඝරාජ හිමි, විල්ගම්මුල : කුරුණෑගල

පාලි අනාගත වංශය හා එහි අටුවාව වූ සමන්තභද්දිකා යන කෘතිද්වය ඇසුරෙන් කළ අනාගතයේ පහළ වන මෛත්‍රී බුදුන් පිළිබඳ ව කරන ලද විස්තර වර්ණනාවක් සහිත කෘතියකි.

- අනාගත වංශය
- අනාගත වංශයඃ මෙතේ බුදු සිරිත
- අනාගත වංශය හෙවත් මෙතේ බුදු සිරිත
- මෙතේ බුදු සිරිත හෙවත් අනාගත වංශය
- සිංහල අනාගත වංශය

## අභිධර්මාර්ථ සංග්‍රහ සන්‍යය

*Abhidharmārtha Saṅgraha Sannaya*

සාරිපුත්ත හිමි : පොළොන්නරුව

අභිධර්මය හකුළුවා හෙවත් සංග්‍රහ කරමින් ලියූ පොතකි. පාලි සිංහල විස්තරාර්ථ සන්‍යය සහිතයි.

- අභිධර්මාර්ථ සංග්‍රහ ප්‍රශ්නෝත්තර ව්‍යාඛ්‍යානය
- අභිධර්මාර්ථ සංග්‍රහ විස්තර භාව සන්නය
- අභිධර්මාර්ථ සංග්‍රහ විස්තර සන්නය
- අභිධර්මාර්ථ සංග්‍රහ ශුද්ධිය
- අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය
- අභිධර්මාර්ථ සංග්‍රහ සන්‍යය

## අමාවතුර

*Amāvatura*

ගුරුළුගෝමී : පොළොන්නරුව

පාලි ත්‍රිපිටකය හා අටුවා මූලාශ්‍රය කොට පුරිසධම්ම සාරථී ගුණය වර්ණනා කරමින් රචිත ගද්‍ය කෘතියකි.

- අමාවතුර
- අමාවතුර : 11-18 වැනි පරිච්ඡේද
- අමාවතුර : 09-14 වැනි පරිච්ඡේද
- අමාවතුර : පරසන්තාන, ගහපති, අඟුල්මල්, නන්දෝපනන්ද, නාලාගිරි දමන
- අමාවතුර (ද්විතීය භාගය)
- අමාවතුර නම් ධර්ම ප්‍රබන්ධය (පූර්ව භාගය)
- අමාවතුර නම් ධර්ම ප්‍රබන්ධය (තෘතීය භාගය)
- ආචාර්ය ගුරුළුගෝමීන් විසින් විරචිත අමාවතුර (පූර්ව භාගය)
- ගුරුළුගෝමීන් විසින් කරන ලද අමාවතුර නම් පුරිසධම්ම සාරථී පද වර්ණනාව
- ගුරුළුගෝමීන් විසින් විරචිත අමාවතුර
- පූජ්‍යාචාර්ය ගුරුළුගෝමීන් විසින් විරචිත අමෘතවාහ නම් ධර්ම ප්‍රබන්ධය

### අඹ විදමන

*Amba Vidamana*

—— ඃ මහනුවර

පත්තිනි දේවියගේ ජීවන පුවතට සම්බන්ධ **අඹ විදමන** පුරාවෘත්තය හා බැඳුණු සිව්පද 198කින් යුත් කාව්‍ය කෘතියකි.

[අප්‍රකාශිතයි.]

### අස්ගිරි තල්පත

*Asgiri Talpata*

—— ඃ මහනුවර

අස්ගිරි විහාරය ඇරඹීම හා එහි විකාශය පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථයකි.

- අස්ගිරි තල්පත

### ඇහැළේපොළ වර්ණනාව

*Ähäḷēpoḷa Warnanawa*

වැලිගල කවිසුන්දර මුදලි ඃ මහනුවර

ඇහැළේපොළ අධිකාරම්ගේ සේවය අගයමින් හා ඔහුට දේව ආශීර්වාදය පතා කවි හා සින්දු 271ක් ඇතුළත් කොට ලියන ලද ප්‍රශස්ති කාව්‍ය කෘතියකි. **වඩුග හටන** නමින් ද හැඳින්වේ.

- ඇහැළේපොළ වර්ණනාව
- ඇහැළේපොළ වර්ණනාව හෙවත් වඩුග හටන

### ඇහැළේපොළ හටනෙ

*Ähäḷēpoḷa Haṭane*

—— ඃ මහනුවර

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් ඇහැළේපොළ කුමාරිහාමි ඇතුළු පිරිස මරා දැමූ පුවත කවියෙන් විස්තර කළ කෘතියකි.

- ඇහැළේපොළ හටන
- ඇහැළේපොළ හටනෙ හෙවත් දරු කෙටවීම
- පුරාණ ඇහැළේපොළ හටනේ

### ඉංග්‍රීසි හටන

*Iṅgrīsi Haṭana*

වැලිගල කවිසුන්දර මුදලි ඃ මහනුවර

1803 වර්ෂයේ දී මහනුවර යටත් කර ගැනීමට ගිය ඉංග්‍රීසි හමුදා හා සිංහලයන් අතර ඇති වූ යුද්ධය වර්ණනා කළ හටන් කාව්‍යයකි.

- ඉංග්‍රීසි හටන හෙවත් ඉංග්‍රීසි සිංහල මහා යුද්ධය
- ඉංග්‍රීසි හටන

### උපාසක ජනාලංකාරය

*Upāsakajanālaṃkāraya*

ධම්මබන්ධ හිමි, මොරතොට ඃ මහනුවර

දඹදෙණි සමයේ රචිත **උපාසකාලංකාර** නම් පාලි කෘතියෙහි සිංහලානුවාදය යි.

- උපාසකජනාලංකාර

### උම්මග්ග ජාතකය

*Ummagga Jātakaya*

—— ඃ කුරුණෑගල

ප්‍රඥා පාරමිතාවේ අගය පෙන්වන ජාතක කතාවකි. අට ජාතක දස ජාතකයන්ට අයත් වේ.

- උම්මග්ග ජාතකය
- උම්මග්ග ජාතකය (කේවට්ට කුමන්ත්‍රණයේ පටන් අවසානයට)
- උම්මග්ග ජාතකය ඃ ගැටපද සහිතයි
- උම්මග්ග ජාතකය ඃ පරිකන්ද කතාවේ අග සිට අවසානය දක්වා
- උම්මග්ග ජාතකය ඃ පාසල් හා පිරිවෙන් සඳහා නිර්දේශිත ගැටපද විවරණ සහිත
- උමංදාව ඃ මහා උම්මග්ග ජාතකය
- ලීනාර්ථ වර්ණනා සහිත උම්මග්ග ජාතකය
- සිතුවම් සහිත උම්මග්ග ජාතකය
- උම්මග්ග ජාතකය හෙවත් උමංදාව

### උමංදා කව

*Umaṃdā Kava*

සිරිසුමිත්ත හිමි, මඩිහේ : නූතන යුගය (ක්‍රි. 1832-1840)

**උම්මග්ග ජාතකය** පදනම් කොට ගෙන කාව්‍ය 3950කින් යුක්ත ව රචිත දීර්ඝ සිව්පද කාව්‍යයකි.

- මඩිහේ සිරිසුමිත්ත හිමිගේ උමං දා කව

### අත්තනගලු වංස සන්නෙ හෙවත් එළු අත්තනගලු වංසය

*Attanagalu Vaṃsa Sannne hevat Eḷu Attanagalu Vaṃsaya*

— : ගම්පොළ

සිරිසඟබෝ රජු හා අත්තනගලු විහාරය වර්ණනා කිරීමට පාලියෙන් රචිත **හත්ථවනගල්ල විහාර වංස** නැමැති කෘතියට සිංහලෙන් කරන ලද භාව සන්නයයි. සිංහලයේ දුර්ලභ චම්පු කාව්‍ය ආකෘතියෙන් රචනා වී ඇති භාව සන්න කෘතියකි.

- අත්තනගලු වංස සන්නේ හෙවත් එළු අත්තනගලු වංසය
- එළු අත්තනගලු වංශය
- එළු අත්තනගලු වංශ විවරණය
- එළු අත්තනගලු වංශ සන්දේශය
- එළු අත්තනගලු වංසය
- එළු අත්තනගලු වංස ප්‍රදීපය
- එළු අත්තනගලු වංශය අභිනව සිංහල ඉංග්‍රීසි ග්‍රන්ථ පද විවරණය සහිතයි
- එළු හත්ථවනගලු විහාර වංශය
- පදාර්ථ සන්න සහිත අත්තනගලු විහාර වංශය

### අත්තනගලු විහාර වංශය

*Attanagalu VihāraVaṃśaya*

— : කෝට්ටේ

පාලියෙන් රචිත හත්ථවනගල්ල විහාර වංශය ඇසුරින් වීදාගම මෛත්‍රෙය හිමියන් විසින් කරීත උන්වහන්සේගේ ශිෂ්‍යයකු විසින් ලිඛිත බව කෘතියේ දැක්වේ.

පාලි හත්ථවනගල්ල විහාර වංශයත් ගම්පොළ යුගයේ ලියවුණු එළු අත්තනගලු වංසයත් ඇසුරු කොට සකුවට බර සිංහල බසින් ලියවුණු කෘතියකි.

- එළු අත්තනගලු වංශ පෙහෙළිය
- වීදාගම ශ්‍රී මෛත්‍රීය සංඝරාජ මාහිමියාණන් වහන්සේගේ එළු අත්තනගලු වංශය
- සිංහල අත්තනගලු වංසය
- එළු අත්තනගලු විහාර වංශය වීදාගම පිටපත

### එළු උමංදාව

*Eḷu Umaňdāva*

දෙවැනි විද්‍යාචක්‍රවර්තී : —

පාලි ජාතකට්ඨ කථාවේ එන දස ජාතකයන්ට අදාළ උම්මග්ග ජාතක අටුවාව පදනම් කොට රචිත පැරණිම කෘතිය සේ සැලකේ.

- එළු උමංදාව
- එළු උමංදාව

### එළුසඳැස් ලකුණ

*EḷuSaňdas  Lakuṇa*

භද්‍ර හිමි : දඹදෙණිය

සිංහල කාව්‍යකරණය සඳහා අවශ්‍ය ඡන්දස් හඳුන්වන කෘතියකි.

- එළු සඳැස් ලකුණ
- එළු සඳැස් ලකුණ, Elu Chandasaya. Bhadra Thera
- එළු සඳැස් ලකුණ : පෙළ සරල අර්ථය සහ ව්‍යාඛ්‍යාන සහිතයි.
- සන්න සහිත එළු සඳස් ලකුණ

### එළු සිලෝ ශතකය

*Eḷu Silō Śatakaya*

— ‍ඃ කෝට්ටේ

නව අරහාදි බුදු ගුණ බැතියෙන් වර්ණනා කරමින් රචිත සිලෝ 102කින් යුත් ශතක කාව්‍යයකි.

- එළු සිලොව
- එළු සිලෝ ශතකය

### ඔකොඳපොළ සන්නය

*Okoňdapola Sannaya*

ධම්මජෝති හිමි, සිටිනාමලුවේ ඃ මහනුවර

බාලාවතාරය ඇසුරෙන් පාලි භාෂාවේ පද සිද්ධි ක්‍රමාදිය දැක්වීම සඳහා කරන ලද සන්න කෘතියකි.

- බාලාවතාරෝ

### කඨිනානිසංසය

*Kaṭhinānisaṃsaya*

— ඃ කෝට්ටේ

කඨිනය පිළිබඳ සවිස්තර විභාග දැක්වෙන අත්පොතකි. බුදු සිරිත, කඨින උපත හා කඨින දානයේ අනුහස් විස්තර කෙරේ.

- කඨිනානිසංසය
- භික්ෂු සීලය
- වස්සානය - සිවුරේ කථාව සහ කඨිනානිසංසය

### කඳවුරු සිරිත

*Kaňdavuru Sirita*

— ඃ දඹදෙණිය

දෙවන පැරකුම් රජුගේ දින චර්යාව වර්ණනා කරමින් රචිත කෘතියකි.

- දඹදෙණි අස්න හා කඳවුරු සිරිත

### කර්ම විභාගය

*Karma Vibhāgaya*

— ඃ දඹදෙණිය

අෂ්ට මහා නරකය, දුක්ඛ විභාගය, දානඵල, මනුෂ්‍යාත්වයේ අගය, කුසල් කිරීමේ අගය ගැන විස්තර කරමින් රචිත කෘතියකි.

- කර්ම විභාගය
- කර්මචතුස්සකය හෙවත් චාතුර්විධ කර්ම විභාගය
- දස අකුසල - කර්ම විභාගය

### කව්මිණි කොඬොල

*Kavmiṇi Koṇḍola*

පත්තායමේ ලේකම් ඃ මහනුවර

ජයද්දිස ජාතකය පදනම් කොට කාව්‍ය 724කින් යුක්ත ව රචිත සිව්පද කාව්‍යයකි.

- සන්න සහිත කව්මිණි කොඬොල
- කව්මිණි කොඬොල
- කව්මිණි කොඬොල (කවි)

### කව්මිණි මල්දම

*Kavmiṇi Maldama*

කටුවාණේ දිසානායක මුහන්දිරම් ඃ මහනුවර

සෝණක ජාතකය පදනම් කොටගෙන කාව්‍ය 724කින් යුක්තව රචිත සිව්පද කාව්‍යයකි.

[විශේෂ කරුණු ඃ මේ කෘතියත් කව්මිණි කොඬොලත් ඒවායේ කර්තෘවරුන් කතිකා කොට එක ම කවි ගණනක් සිටින සේ ලියන ලද බව පැවසේ. දුෂ්කර බන්ධන සහිත යි.]

- කව්මිණි මල්දම

**කව්මිණි රන්දම**

*Kavmiṇi Randama*

සිරි සුමිත්ත හිමි, මඩිහේ ඃ නූතන යුගය

පංචායුධ ජාතකය පදනම් කොට බුදුගුණ වැනීම උදෙසා කාව්‍ය 395කින් යුක්ත ව රචිත සිව්පද කාව්‍යයකි.

**කව් මුතුහර**

*Kav Mutuhara*

මණිරතන හිමි, සාලිඇලේ ඃ නූතන යුගය (18/19 සියවස් අතර කාලය)

දශරථ ජාතකය පදනම් කොටගෙන රචිත මහා කාව්‍යයකි.

- කව්මුතුහර

**කව් මුතුහර නොහොත් කාංචන දේවි කතාව**

*Kav Mutuhara nohot Kāñcana Dēvi Katāva*

ධම්මානන්ද හිමි, කිරම ඃ නූතන යුගය

සද්ධර්මලංකාරයේ එන කාංචන දේවි කතාව කවියට නගමින් කිරම ධම්මානන්ද හිමියන් කළ රචනයකි. පතිවත රැකීමේ අගය පහදමින් ලියන ලද්දකි.

- කව් මුතුහර නොහොත් කාංචන දේවි කතාව

**කව් ලකුණු මිණ**

*Kav Lakuṇu Miṇa*

මෛත්‍රෙය හිමි, වීදාගම ඃ කෝට්ටේ

කවීන්ගේ දැනුම් සඳහා ගණ, අකුරු, නැකැත් ආදිය පිළිබඳ උපදෙස් ලබා දීමට රචනා වූ කෘතියකි.

- කව් ලකුණු මිණ හෙවත් සෙත් කවි හදන හැටි

**කවිලකුණුමිණිමල**

*Kavilakuṇumiṇimala*

මෛත්‍රෙය හිමි, වීදාගම ඃ කෝට්ටේ

ලකුණුසර අනුව ලියවුණු තවත් කෘතියකි. අකුරු, නැකත් පිළිබඳ විස්තර විභාග දක්වන කෘතියකි.

(අප්‍රකාශිතයි)

**කව්සිළුමිණ**

*Kavsiḷumiṇa*

පණ්ඩිත පරාක්‍රමබාහු රජු, II ඃ දඹදෙණිය

කුස ජාතකය පදනම් කොට ගනිමින් සංස්කෘත අලංකාරවාදී සම්ප්‍රදායානුගත මහා කාව්‍ය ආකෘතියෙන් රචිත ගී කාව්‍යයකි.

- කලිකාල සර්වඥ පණ්ඩිත ද්වීතීය විජයබාහු මහ රජතුමා විසින් විරචිත කව්සිළුමිණඃ කල්පලතා ව්‍යඛ්‍යා සහිත
- කව්සිළුමිණ
- කව්සිළුමිණ : කලිකල් සවනි පඬි ඉඳුහුගේ කුසදා නම් කව්සිළුමිණ
- කව්සිළුමිණ : උපාධි පරීක්ෂණයට නියමිත
- කව්සිළුමිණ : උපාධි පරීක්ෂණ වලට නියමිත
- කව්සිළුමිණ : කොටස 2
- කව්සිළුමිණ : පදාර්ථ ව්‍යාඛ්‍යාන සහිත
- කව්සිළුමිණ පෙළගැස්ම
- කව්සිළුමිණ මහා කාව්‍ය : විමර්ශන සහිත කොටස 2
- කව්සිළුමිණ : වැලිවිටියේ සෝරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් කළ විශේෂ ශුද්ධියකින් හා කල්පලතා නම් විස්තර වර්ණනාවෙන් ද යුක්තයි.
- කව්සිළුමිණඃ විමර්ශන සහිත කව්සිළුමිණි මහා කාව්‍ය
- කව්සිළුමිණ විවරණය
- කව්සිළුමිණ විවරුව

- කව්සිළුමිණ සරල සන්න සහිත කව්සිළුමිණ : 6, 9, 10, 11, 12 සර්ග
- කව්සිළුමිණ : 6,7,10,11 සර්ග
- කව්සිළුමිණ : 6,10,11,12 සර්ගඃ කලිකල් සවැනි නිරිඳු කළ
- කව්සිළුමිණ හෙවත් කුසදාවත
- කව්සිළුමිණ හෙවත් කුසදාවත : පැරණි සන්නය සහිතයි.
- කව්සිළුමිණ - හෙළ කව්ලොව සිළුමිණ වූ කව්සිළුමිණ 2
- Crest-gem of Poetry: kavsiḷumiṇa: the Sinhala epic in English verse
- පදාර්ථ ව්‍යාඛ්‍යාන සහිත කව්සිළුමිණ
- හෙළ කව් ලොව සිළුමිණ වූ කව්සිළුමිණ

**කහකුරුළු සඳෙස**

*Kahakuruḷu Sandēśa*

දික්වැල්ලේ සාමණේර හිමි : මහනුවර

අට වන වීර පරාක්‍රමබාහු රජුට සෙත් පැතීම, තමාගේ මුහුණේ ඇති රෝගයක් දුරු කර ගැනීම ආදි ඉල්ලීම් කීපයක් ඉටුකර ගැනීම සඳහා කහ කුරුල්ලෙකු දූතයා කොට ගලගම සිට කතරගම දක්වා ගමන් මාර්ග කොට යැවෙන සේ රචිත සිව්පද 244කින් යුක්ත සංදේශ කාව්‍යයකි.

කතරගම දෙවිඳුට සංදේශ කවි 1700-1900ඃ කහකුරුළු සංදේශය, නීලකොබෝ සංදේශය, කැට කිරිලි සංදේශය, දිය සැවුල් සංදේශය, මයූර සංදේශය, වටු සංදේශය

**කාංචි කතාව**

*Kāñci Katāva*

— : නූතන යුගය (අවසාන භාගය)

කියවන්නන් වෙත විසිතුරු කතා කවිකර පෑමේ රුචිය අනුව ලියවුණු පොතකි. කුමර - කුමරි දෙදෙනෙකුගේ ප්‍රේමය මුල් කොට ඇති වූ කතා පුවතකි.

**කාලිංග බෝධි ජාතක කාව්‍යය**

*Kāliṅga Bōdhi JātakaKāvyaya*

දුනුවිල ගජනායක නිළමේ : මහනුවර

කාලිංග බෝධි ජාතකයත් ධර්මප්‍රදීපිකාවේ සුළු කලිඟු දා වතත් පදනම් කොට රචිත පද්‍ය 676කින් යුක්ත සිව්පද කාව්‍යයකි.

- කාලිංග බෝධි ජාතක කාව්‍යය

**කාව්‍යශේඛරය**

*Kāvyaśēkharaya*

රාහුල හිමි, තොටගමුවේ ශ්‍රී : කෝට්ටේ

සත්තුභත්ත ජාතකය පදනම් කොට ගනිමින් සංස්කෘත අලංකාරවාදී සම්ප්‍රදායානුගත මහා කාව්‍ය ආකෘතියෙන් රචිත සිව්පද කාව්‍යයකි. සර්ග 15කින් හා පද්‍ය 887කින් යුක්ත ය.

- කාව්‍යශේඛර ඥානොදය ව්‍යාඛ්‍යා (1-5 සර්ග)
- කාව්‍යශේඛර ඥානොදය ව්‍යාඛ්‍යාන (අවසන් භාගය)
- කාව්‍යශේඛරය
- කාව්‍යශේඛරය : කාව්‍යශේඛරය මහා කාව්‍යය
- කාව්‍යශේඛරය මහා කාව්‍යය
- කාව්‍යශේඛරය විවරණය
- කාව්‍යශේඛරය : ශාස්ත්‍රෝදය ව්‍යාඛ්‍යා සහිතයි
- කාව්‍යශේඛර සංග්‍රහය
- කාව්‍යශේඛර සංග්‍රහය විවරණ
- කාව්‍යශේඛර සංජීවනී ව්‍යාඛ්‍යා
- තොටගමුවේ ශ්‍රී රාහුල සංඝරාජ මහා ස්වාමිපාදයාණන් වහන්සේ විසින් විරචිත කාව්‍යශේඛරය පිළිබඳ ගැටපද විවරණ සහිත වළාණේ සන්නය.
- තොටගමුවේ ශ්‍රී විජයබාහු පරිවෙණාධිපති ෂඩ්භාෂා පරමෙශ්වර ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය ශ්‍රී රාහුල සංඝරාජ මාහිමියන් වහන්සේ විසින් විරචිත කාව්‍යශේඛර මහා කාව්‍ය

- තොටගමුවේ ශ්‍රී සංඝබෝධි ශ්‍රී විජයබාහු පරිවෙණාධිපති ෂඩ්භාෂා පරමෙශ්වර ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය ශ්‍රී රාහුල සංඝරාජ මාහිමියන් වහන්සේ විසින් විරචිත කාව්‍යශේඛර මහා කාව්‍යය සඳහා පාඨ ශෝධන පූර්වක තත් පදාර්ථ වර්ණනා භූත සඤ්ජීවනී ව්‍යාඛ්‍යාව

- ශ්‍රී රාහුල සංඝරාජවර ප්‍රණීත කාව්‍යශේඛර මහා කාව්‍යය

- සන්න සහිත කාව්‍යශේඛරය

- සිරි රහල් පබඳ

### කැට කිරිලි සන්දේශය

*Käṭa Kirili Sandēśaya*

දොරපනේ කිවිඳා ː මහනුවර

මෙය ශ්‍රී පාදස්ථානය භාරකාර සුමන දෙවියන් විසින් දිවයිනේ ආරක්ෂාව සලසා දෙන ලෙස කතරගම මහසෙන් දෙවියන්ගෙන් ඉල්ලීමක් කරන අයුරින් රචනා කළ කෘතියකි.

- කතරගම දෙවිඳුන්ට සන්දේශ කවි 1700-1900

### කිරල සන්දේශය

*Kirala Sandēśaya*

කිතලගම හිමි ː මහනුවර

මෙහි සිංහාසනයට ව්‍යාජ හිමිකම් කියූ පුද්ගලයෙකුගේ ගුණ වර්ණනා කරමින් හා ඔහුට ආශිර්වාද පතා මහනුවර සිට ඇඹැක්කේ මහසෙන් දෙවියන් වෙත අස්නක් යැවීම පිළිබඳ අන්තර්ගතය අරමුණු වූ කෘතියකි.

### කුරුණෑගල විස්තරය

*Kuruṇägala Vistaraya*

පුෂ්පදේව තෙරුන්නාන්සේ ː සඳහනක් නැත. භාෂාව අනුව මහනුවර සමයේ යැයි සැලකිය හැකි ය.

කුරුණෑගල හා ඒ අවටත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරත් ගැන ඇති විස්තරයකි.

- කුරුණෑගල විස්තරය ː ශාස්ත්‍රීය සංස්කරණය සහ විමර්ශනය

### කුවේණි අස්න

*Kuvēṇi Asna*

උතුරුමුල මහතෙරිඳු ː කෝට්ටේ

සිරි පැරකුම් රජුගේ රෝග හා සතුරු බිය දුරු කරන ලෙස දෙවියන්ගෙන් ඉල්ලන සේ රචිත කාව්‍ය කෘතියකි

- කුවේණි අස්න සහ සිහබා අස්න

- කුවේණි අස්නය සහ සිහබා අස්නය

### කුස ජාතක කාව්‍යය

*Kusa Jātaka Kāvyaya*

අලගියවන්න මුකවෙටි ː සීතාවක

ජාතකට්ඨ කථාවේ එන කුස ජාතකය පදනම් කොට මහා කාව්‍ය සම්ප්‍රදායානුගතව සර්ග 13කින් රචිත කාව්‍ය කෘතියකි.

- කුස ජාතක කාව්‍යය

- කුස ජාතක කාව්‍යය ː සිතියම් සහිත

- කුස ජාතක විවරණය සහිත සම්පූර්ණ සන්න සමඟ කුස ජාතක කාව්‍යය ස්වාමීන් වහන්සේ කෙනෙක් විසින් සන්න කරන ලදී.

### කුස්තන්තීනු හටන (කොස්තන්තීනු හටන)

*Kustantīnu Hatana (Kostantīnu Hatana)*

අලගියවන්න මුකවෙටි ː සීතාවක

කොස්තන්තීනු සා නම් ප්‍රතිකාල් ආණ්ඩුකාරවරයකුගේ සටන් ජයග්‍රහණයක් හා ඔහුගේ වීරත්වය වර්ණනා කිරීම උදෙසා රචිත කාව්‍ය 175කින් යුත් සිව්පද කාව්‍යයකි.

- අලගියවන්න මුකවෙටි තුමන්ගේ කුස්තන්තීනු හටන

- අලගියවන්න මුකවෙටි තුමා විසින් විරචිත කුස්තන්තීනු හටන

- කුස්තන්තීනු හටන

### කෝකිල සන්දේශය

*Kōkila Sandēśaya*

ඉරුගල් කුලතිලක පිරුවන් හිමි ඃ කෝට්ටේ

යාපා පටුනේ යුවරාජ පදවිය දැරූ සපුමල් කුමරුට හා අවශේෂ ප්‍රභූ ජනයාට සෙත්පතා, කෝකිලයකු දූතයකු ලෙස යොදා දෙවිනුවර සිට යාපනය දක්වා ගමන් මග කොට, විෂ්ණු දෙවියන්ට හසුන්පත් යැවුණු සේ රචිත කවි 292කින් යුත් සන්දේශ කාව්‍යයකි.

- ඉරුගල්කුලතිලක පරිවේණාධිපති ෂඩ් භාෂා පරමේශ්වර මහා ස්වාමිපාදයන් විසින් විරචිත කෝකිල සන්දේශය
- කොවුල් සඳෙස් විවරණය
- කෝකිල සන්දේශ ප්‍රථම භාගය
- කෝකිල සන්දේශ ද්වීතික භාගය
- කෝකිල සන්දේශය
- කෝකිල සන්දේශය ඃ කොවුල් සඳැස් විවරණය
- කෝකිල සන්දේශය - තෘතීය කාණ්ඩය
- කෝකිල සන්දේශය ඃ පුරාතන සන්නයෙන්ද යුක්තයි.
- කෝකිල සන්දේශය ඃ සාරදීපිකා කෝකිල සන්දේශය වර්ණනාව
- කෝකිල සන්දේශය ඃ හැඳින්වීම පද්‍ය විචාර හා වදන්වලින් ද යුතු වෙයි.
- කෝකිල සන්දේශ වර්ණනා
- කෝකිල සන්දේස - 1 කොටස
- ඥාණෝදය ව්‍යඛ්‍යා සහිත කෝකිල සන්දේශය

### ගංගාරෝහණ වර්ණනාව

*Gangārōhaṇa Varṇanāva*

දිසානායක, තෝමිස් සමරසේකර ඃ  මහනුවර

කෘතිය රචිත වර්ෂයේ නිල්වලා නදියේ සරම් විජේසේකර මුදලිඳුගේ අනුග්‍රහයෙන් පැවති පූජෝත්සවයත්, උක්ත මුදලිඳුත් වර්ණිත ව රචිත සිලෝ ශතක කාව්‍යයකි. (පසු කලෙක සව්සත්දම්වාදය සිදු වූයේ ද මේ කාව්‍ය කෘතිය මුල් කොටගෙනය.)

- ගංගාරෝහණ වර්ණනා විවරණය

### ගඩලාදෙණි සන්නය

*Gaḍalādeṇi Sannaya*

ජයබාහු මා හිමි, සංඝරාජ ධර්මකීර්ති ඃ කෝට්ටේ

බාලාවතාරය සඳහා ඒ යුගයේ දී ම කතු හිමියන් විසින් ම කරන ලද සන්නයකි.

- ගඩලාදෙණි සන්නය හෙවත් බාලාවතාරයෙහි පුරාණ ව්‍යඛ්‍යානය
- බාලාවතාර ගඩලාදෙණි සන්නය
- බාලාවතාර පුරාණ ව්‍යඛ්‍යානය

### ගණ දෙවි හැල්ල

*Gaṇa Devi Hǟlla*

— ඃ මහනුවර

ගණ දෙවියන් වැඳ අකුරු ලිවීම ආරම්භ කරන අයුරු දක්වන කෘතියකි.

- ගණදෙවි හැල්ලයි, වදන් කවි පොතයි, තරු අකුරු වැලයි.
- ජන කාව්‍ය සංග්‍රහය ඃ තුන් සරණය, පුරාණ පත්තිනි හැල්ල, ගණදෙවි හැල්ල, වදන් කවි පොත, නම් පොත, බුද්ධ ගජ්ජය, සකස්කඩ, මුතු කුමාරිගේ කතාව, සින්නමුත්තු කතාව
- පැරණි අකුරු කරවන පොත් පෙළ ඃ සිංහල හෝඩිය, නම් පොත, මඟුල් ලකුණ, ගණදෙවි හැල්ල, වදන් කවි පොත, බුද්ධ ගජ්ජය, සකස්කඩ
- මූලික පිරිවෙන් පොත් ඃ සිංහල හෝඩිය, නම් පොත, මඟුල් ලකුණ, ගණදෙවි හැල්ල, වදන් කවි පොත, බුද්ධ ගජ්ජය, සකස්කඩ
- වදන් කවි පොත සහ ගණදෙවි හැල්ල ඃ සරල සන්න සහිතව සකස් කරන ලද

## ගිරා සන්දේශය

*Girā Sandēśaya*

—— : කෝට්ටේ

vi වන පැරකුම් රජුට සෙත් පතන ලෙස රාහුල හිමියන්ගෙන් ඉල්ලා ගිරවකු දූතයාකොට ලියූ පද්‍ය 294කින් යුත් සන්දේශ කාව්‍ය කෘතියකි.

- අභිනව සන්න සහිත ගිරා සන්දේශය
- ගිරා සන්දේශය
- ගිරා සන්දේශය : අරුත් පහදු විවරණය
- ගිරා සන්දේශය : බාහිර කලා යෝග්‍යතා පරීක්ෂණයට හා පිරිවෙන් විභාගවලට නියමිත
- ගිරා සන්දේශය : උසස් පෙළ නිර්දිෂ්ට කෘතිය හැදෑරීම
- ගිරා සන්දේශය : විචාරය හා රසාස්වාදය
- ගිරා සන්දේශය : විචාරාත්මක නිරීක්ෂණය අ.පො.ස උසස් පෙළ සිංහල
- ගිරා සන්දේශය : විමසුම
- ගිරා සන්දේශ විමර්ශනය
- ගිරා සන්දේශ විවරණය
- ගිරා සංදේශ වණ්ණනා
- ජයවර්ධනපුර විහාරවාසී යතිවරයෙකු කළ ගිරා සංදේශය
- පුරාතන පද්‍ය සාහිත්‍යය ගිරා සන්දේශය විචාරය : අ.පො.ස උසස් පෙළ සඳහා
- වියරණ විනිස සහිත ගිරා සඳෙස
- සටහන් සහිත ගිරා සන්දේශය
- සාරදීපිකා ගිරා සන්දේශ වර්ණනා
- සිංහල බෝධිවංශය, ගිරා සන්දේශය, ඩිංගිරි මැණිකා යන ග්‍රන්ථ පිළිබඳ සවිස්තරාත්මක විවරණයක්
- සිංහල සාහිත්‍යය විමසුම : මූලික පිරිවෙන් අවසාන විභාගයට නියමිත

## ගුත්තිල කාව්‍යය

*Guttila Kāvyaya*

වැත්තෑවේ හිමි : කෝට්ටේ

ගුත්තිල ජාතකය පදනම් කොට ගනිමින් කතුවරයා සංස්කෘත අලංකාරවාදයට ගැති නොවී ස්වාධීන මගකින් රචිත පද්‍ය 511කින් යුත් සිව්පද කාව්‍යයකි.

- අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා 2017 වර්ෂයේ සිට නියමිත ගුත්තිල කාව්‍යයඃ කතා ප්‍රස්තාවය හා සමාප්ති සම්පිණ්ඩනය සහිතව 91-317 පැදි
- අර්ථ විවරණය සහිත ගුත්තිල කාව්‍යය : 2017 වසරේ සිට අ.පො.ස (උ.පෙළ) විභාග යේ සිංහල විෂය සඳහා නිර්දේශිත කවි
- අලංකාර දර්ශනය සහිත ගුත්තිල කාව්‍ය වර්ණනා
- උම්මග්ග ජාතකය (පරිකණ්ඩ කතා) සහ ගුත්තිල කාව්‍යය (114-224)
- ගුණවර්ධන මන්ත්‍රී ප්‍රණීත ගුත්තිල වර්ණනා
- ගුත්තිල කවි මිහිර
- ගුත්තිල කව : (91-224 පද්‍ය)
- ගුත්තිල කාව්‍ය (91-317 පද්‍ය) : 2017 වර්ෂයෙහි සිට උසස් පෙළ 12-13 ශ්‍රේණි සඳහා නියමිත පද්‍ය ඇතුළත්
- ගුත්තිල කාව්‍ය : 114-404
- ගුත්තිල කාව්‍ය දීපනී
- ගුත්තිල කාව්‍ය වර්ණනා
- ගුත්තිල කාව්‍යය
- ගුත්තිල කාව්‍යය (114-318 පද්‍ය)
- ගුත්තිල කාව්‍යය : ගුත්තිල කාව්‍ය වර්ණනා
- ගුත්තිල කාව්‍යය : රසවිඳීම හා විචාරය
- ගුත්තිල කාව්‍යය : විවිධ උසස් විභාග සඳහා නියමිත
- ගුත්තිල කාව්‍ය විවරණය
- ගුත්තිල ගීතය : ගුත්තිල කාව්‍ය විචාරය
- ගුත්තිල දා කවි ප්‍රදීපය

- ගුත්තිල මහා කාව්‍යය
- ගුත්තිල සාරය
- ගුප්තිල කාව්‍යය
- ජන කවි ගුත්තිල උමංදා විවරණ
- පොදු සහතික සාහිත්‍යය : සද්ධර්මරත්නාවලිය, ගුත්තිල කාව්‍යය, ජයතු ලංකා, මනුතාපය
- වැත්තෑවේ තෙරිඳුන් කළ ගුත්තිල කාව්‍යය
- සන්න සහිත ගුත්තිල කාව්‍යය
- සාහිත්‍ය විචාරය : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට නියමිත සිංහල ජනකවි සංග්‍රහය ගුත්තිල කාව්‍යය හා උම්මග්ග ජාතකය පිළිබඳ අංග සම්පූර්ණ විචාරයකි.

**ජාතක අටුවා ගැටපදය**

*Jātaka Aṭuvā Gätapadaya*

— : පොළොන්නරුව

පාලි බසින් ඇති ජාතක අටුවාවට හෙළ බසින් (සිංහලෙන්) කරනු ලැබූ ගැටපද විවරණයයි.

- ජාතක අටුවා ගැටපදය
- ජාතක අටුවා ගැටපදය : ද්වීතීය භාගය
- ජාතක අටුවා ගැටපදය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**තිසර සන්දේශය**

*Tisara Sandēśaya*

— : ගම්පොල

පැරකුම්බා නම් රජකුට දෙවිනුවර උපුල්වන් දෙවිඳුගෙන් ආසිරි පැතු බව දන්වනු පිණිස දෙවිනුවර සිට දැතිගම දක්වා ගමන් මග කොට තිසරයකු දූතයකු කොට රචිත, දැනට විද්‍යමාන සන්දේශ කාව්‍ය අතර පුරාණත ම සන්දේශ කෘති දෙකෙන් එක් කෘතියකි.

- තිසර සන්දේශ දීපනිය
- තිසර සන්දේශය
- තිසර සන්දේශය : සාරදීපිකා තිසර සන්දේශ ව්‍යාඛ්‍යා
- තිසර සන්දේශය - 2 සහ මිදෙල්ලව කෝරලගේ වෙනත් කෘති
- තිසර සන්දේශය : නව ශාස්ත්‍රීය සංස්කරණය
- තිසර සන්දේශය : දෙවිනුවර විසූ යතිතුමකු කළ
- තිසර විවරණය
- විමර්ශන සහිත තිසර සන්දේශය
- සාරදීපිකා තිසර සන්දේශ වර්ණනා
- මිදෙල්ලව කෝරාළගේ තිසර සංදේශය

**තුන් සරණය (පුරාණ තුන් සරණය)**

*Tun Saraṇaya*

— : මහනුවර

තෙරුවන් ගුණ වර්ණිත ව රචිත, සිව්පද 130 කින් යුත් කාව්‍ය ග්‍රන්ථයකි.

- අමෘත ජලාශයන් නොහොත් අභිනව තුන් සරණය
- තුන් සරණය
- පුරාණ තුන් සරණ
- පුරාණ තුන් සරණය

**තෙරුවන් මාලා**

*Teruvanmālā*

සරණංකර සංඝරාජ හිමියන්ගේ ශිෂ්‍ය භික්ෂුවක විසින් : මහනුවර

තෙරුවන් ගුණ වර්ණිත ව ශතක කාව්‍ය ආකෘතියට කළ සිලෝ 107කින් යුත් කාව්‍ය ග්‍රන්ථයකි.

- තෙරුවන්මාලා

### දඹදෙණි අස්න

## *Dabadeṇi Asna*

— : කුරුණෑගල

ii පැරකුම් රජුගේ වීරත්වය වර්ණිතව රචිත කෘතියකි.

- ගැටපද විවරණ සහිත කුවේණි අස්න, සිහබා අස්න, දඹදෙණි අස්න
- දඹදෙණි අස්න සහ කඳවුරු සිරිත
- දඹදෙණි අස්න සහ කඳවුරු සිරිත විචාරාත්මක ගවේෂණයක්
- දඹදෙණි කුවේණි සිහබා අස්නත්‍රය : පද විවරණ සහිත

### දඹදෙණි කතිකාවත

## *DabadeṇiKatikāvata*

සංඝරක්ෂිත මාහිමි සහ මේධංකර හිමි, දිඹුලාගල : දඹදෙණිය

දඹදෙණි කාලයේ ලංකා භික්ෂූන් වහන්සේලාගේ පැවැත්මට මෙසේ විය යුතු යැයි යන සංඝ සම්මුතියක් ඇතිකරගත් ව්‍යවස්ථා පන්තිය මේ කෘතියෙහි දැක්වේ. මෙය සාහිත්‍යය ලේඛනයක් වශයෙන් සිංහල සාහිත්‍යයෙහි පැනෙන දෙවන කතිකාවතයි.

- සම්පූර්ණ ගැටපද විවරණ සහිත දඹදෙණි කතිකාවත නම් වූ මහා විහාර කතිකාවත

### දහම් ගැටය

## *Daham Gäṭaya*

ධර්මසේන හිමි : කෝට්ටෙ

දහම් කරුණු ප්‍රධාන අර්ථය වසා අනික් මතුපිට අර්ථයකින් නිරූපනය කරමින් ලියවුණු ගී 59ක් අඩංගු කෘතියකි.

- දහම් ගැටය

### දහම් ගැට මාලාව

## *Daham Gäṭa Mālāva*

මෛත්‍රෙය හිමි, වීදාගම : කෝට්ටෙ

- දහම් ගැට මාලාව
- සන්න සහිත දහම් ගැට මාලාව
- දහම් ගැට මාලය

### දහම්මිණි කව

## *Dahammiṇi Kava*

පුබ්බාබරණ : මහනුවර

බුද්ධ ධර්මය ඇසුරින් පද්‍ය 160කින් යුක්ත ව රචිත උපදේශ කාව්‍යය ග්‍රන්ථයකි.

- දහම්මිණි කව

### දහම් සරණ

## *DahamSaraṇa*

විද්‍යාචක්‍රවර්ති : දඹදෙණිය

සරණ ග්‍රන්ථ පෙළෙහි දෙවැනි ග්‍රන්ථය වන මෙය ද බුත්සරණ මෙන් ම බුදුගුණ වර්ණනාව සඳහා රචිත කෘතියකි.

- අවසාන විභාගයට නියමිත පණ්ඩිත විද්‍යා චක්‍රවර්තී විසින් විරචිත දහම් සරණ
- කවිචක්‍රවර්ති ශ්‍රීමද්විද්‍යා චක්‍රවර්තීන් විසින් විරචිත දහම් සරණ
- දහම් සරණ
- දහම් සරණ : 1
- දහම් සරණ ගැටපද විවරණ
- දහම් සරණ විවරණය (ප්‍රථම භාගය)
- දහම් සරණඃ සිංහල සරණ සාහිත්‍යය 2

### දහම්සොඬ කාව්‍යය

*Dahamsoṇḍa Kāvyaya*

අලගියවන්න මුකවෙටි ː සීතාවක

ජාතක අටුවාවේ නොදැක්වෙන එහෙත් ජනප්‍රවාදයේ එන දහම්සොඬ ජාතකය පදනම් කොට පද්‍ය 163කින් යුත් සිවුපද කාව්‍යයකි.

- අලගියවන්න මුකවෙටිතුමන් විසින් විරචිත දහම්සොඬ කව
- දහම්සොඬ කාව්‍යය
- දහම්සොඬ කාව්‍ය - පරිකතා සහිත
- ධර්මද්වජ පඬිතුමාගේ දහම්සොඬ කාව්‍යය

### දළදා පූජාවලිය

*Daḷadā Pūjāvaliya*

—— ː කුරුණෑගල

පාලි දාඨාවංසය හා තවත් කෘති කිහිපයක් ඇසුරු කොට බුද්ධ චරිතයේ පටන් දළදාවෙහි ඉතිහාස ප්‍රවෘත්තිය රචිත ගද්‍ය කෘතියකි.

- 1955-1957 ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයට නියමිත කුරුණෑගල සමයේ යම්කිසි විද්වතකු විසින් විරචිත දළදා පූජාවලිය
- දළදා පූජාවලිය
- දළදා පූජාවලිය පද්‍ය කාව්‍ය
- ප්‍රදීපිකා සහිත දළදා පූජාවලිය
- සිංහල පදගතාර්ථ සහිත දළදා පූජාවලිය

### දළදා විත්තිය

*Daḷadā  Vittiya*

—— ː මහනුවර

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දවස දළදා වහන්සේට කළ පූජාත්, දළදා වහන්සේ සතුරන්ගෙන් ආරක්‍ෂා කරගත් ආකාරයත් දැක්වෙන කුඩා ග්‍රන්ථයකි.

- දළදා විත්තිය

### දළදා සිරිත

*Daḷadā Sirita*

දෙව්රද දම් පසඟිනාවන් ː කුරුණෑගල

පාලි දාඨාවංසය පදනම් කොට ගෙන දළදා පුවත දැක්වීමට වෘත්ත ගන්ධි ශෛලියෙන් රචිත ගද්‍ය කෘතියකි

- ගද්‍ය සාහිත්‍යය නව මගකට යොමුකළ දළදා සිරිත
- දළදා සරණේ කතාවෙන් පැවසෙන ආශ්චර්යාත්මක දළදා සිරිත
- දළදා සිරිත
- දළදා සිරිතː දෙව්රද දම්පසඟිනාවන් ප්‍රනීත
- දළදා සිරිත හා වෘත්තගන්ධිය
- දළදා සිරිතේ අසිරිමත් රචනා ශෛලිය
- දෙව්රද දම්පසඟිනාවන් විරචිත දළදා සිරිත
- A Critical Edition of දළදා සිරිත

### දාඨාගොත් පදීපය

*Dāṭhāgot Padīpaya*

වැගලග කිවිඳු ː නූතන යුගය

දළදා පුවත හා දළදා වැඳුමෙහි අගය කියාපාන පද්‍ය කෘතියකි.

- දාඨාගොත් පදීපය

### දිය සැවුල් සන්දේශය

*Diya Sävul Sandēśaya*

තල්අරඹේ ධම්මක්ඛන්ධ හිමි ː මහනුවර

කතුවරයා ස්වකීය පා දෙකෙහි හටගත් රෝග යක් සුව කර දෙන ලෙස කරන දේවායාචනයක් ලෙස රචිත සන්දේශයකි.

- කතරගම දෙවිඳුට සංදේශ කව් 1700-1900 ː කහකුරුලු සංදේශය, නීලකොබෝ සංදේශය, කැට කිරිලි සංදේශය, දිය සැවුල් සංදේශය, මයූර සංදේශය, වටු සංදේශය

### දුනුවිල හටන

*Dunuvila Haṭana*

දුනුවිල ගජනායක නිලමේ : මහනුවර

කතුවරයා ගම්වරක් ලබා ගැනීම පිණිස එවක අගමැති වූ ඇහැළේපොළ නිලමේ වර්ණනා කරමින් රචිත කාව්‍ය කෘතියකි.

- දුනුවිල රාජකරුණාධාර ඒකනායක ධර්මකීර්ති පණ්ඩිත මුදියන්සේ රාලහාමින් කළ දුනුවිල හටන
- දුනුවිල හටන
- දුනුවිල හටන 1966 - සාහිත්‍ය විශේෂ කලාපය
- දුනුවිල හටන සහ නාදේනියේ සිංදුව

### ධම්පියා අටුවා ගැටපදය

*Dhampiyā AṭuvāGäṭapadaya*

අභා සලමෙවන් කසුබ් මහරජ (පස්වන කාශ්‍යප රජු සේ සැලකේ) : අනුරාධපුරය

බුද්ධඝෝෂ හිමියන්ගේ ධම්මපදට්ඨ කථාව සඳහා කරන ලද සන්නය වන මෙය දැනට විද්‍යමාන පැරණිම සිංහල කෘතිවලින් එකකි.

- අභා සලමෙවන් කසුබ් මහරජු දහම්පියා අටුවා ගැටපදය
- දහම්පියා අටුවා සන්‍ය ගැටපදය
- දහම්පියා අටුවා සන්නය
- ධම්පියා අටුවා ගැටපදය
- ධම්පියා අටුවා ගැටපදය : i කොටස
- ධම්පියා අටුවා ගැටපදය වචන සූචියඃ සිංහල පාලි සංස්කෘත
- ධම්පියා අටුවා ගැටපද වියරණ නාම සහ ක්‍රියාඃ පද විචාරාත්මක අධ්‍යනයක්
- ධම්පියා අටුවා ගැටපද විවරණය
- ධම්පියා අටුවා ගැටපද ව්‍යාඛ්‍යාව : (අප්පමාද චිත්ත හා පුප්ඵ වග්ග) ද්විතීය භාගය
- ධම්පියා අටුවා ගැටපද ව්‍යාඛ්‍යාව : යමක වග්ගය
- ධම්පියා අටුවා ගැටපද ව්‍යාඛ්‍යාව ප්‍රථම භාගය : යමක වග්ගය
- ධර්ම පදාර්ථකථා ග්‍රන්ථිපදය හෙවත් ධම්පියා අටුවා ගැටපදය
- ශ්‍රී ලංකාධීශ්වර පස්වෙනි කාශ්‍යප මහරජාණන් විසින් විරචිත ධම්පියා අටුවා ගැටපදය

### ධම්මපද සන්නය

*Dhammapada Sannaya*

—– : දඹදෙණිය

ධම්මපද අටුවාවට කරන ලද සන්න ග්‍රන්ථයකි.

- ධම්මපද පාළිය සහ සිංහල ධම්මපදය
- ධම්මපද පුරාණ සන්නය : (with a glossary)
- ධම්මපද විවරණය
- සිංහල ධම්මපද කාව්‍යය : පාලි ධම්මපදයේ පද්‍යමය පරිවර්තනය

### ධර්මප්‍රදීපිකාව

*Dharmapradīpikāva*

ගුරුළුගෝමීන් : පොළොන්නරුව

පාලි මහා බෝධිවංසය සඳහා කෙරුණු ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයකි.

- ආචාර්ය ගුරුළුගෝමීන් විසින් විරචිත මහා බෝධිවංශ පරිකථා උපලක්ෂිත ධර්මප්‍රදීපිකාව
- ආචාර්ය ගුරුළුගෝමීන් විසින් විරචිත මහා බෝධිවංශ පරිකථා සංඛ්‍යාත ධර්මප්‍රදීපිකාව
- ගුරුළුගෝමීන්ගේ ධර්මප්‍රදීපිකා නම් මහා බෝධිවංශ පරිකතාව
- ගුරුළුගෝමීන්ගේ ධර්මප්‍රදීපිකාව සරල බසින්
- ගුරුළුගෝමීන් මහ පඩිතුමන් විසින් විරචිත ධර්මප්‍රදීපිකාව
- ධර්මප්‍රදීපිකා ග්‍රන්ථිපද විවරණය

- ධර්මප්‍රදීපිකා ග්‍රන්ථිපද විවරණය (අවසාන භාගය)
- ධර්මප්‍රදීපිකාව
- ධර්මප්‍රදීපිකාව හෙවත් මහා බෝධිවංශ පරිකථාව
- පූජ්‍යාචාර්ය ගුරුළුගෝමීන් විසින් විරචිත මහා බෝධිවංශ පරිකථා සංඛ්‍යාත ධර්මප්‍රදීපිකාව

**ධාතුවංශය**

*Dhātuvaṅśaya*

කකුසන්ධ හිමි : මහනුවර

පාලි ධාතුවංසය ඇසුරෙන් බුදුන් වහන්සේගේ ලලාට ධාතුව පිළිබඳ විස්තර කතාව දැක්වෙන කෘතියකි.

- 1941 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාග යට නියමිත ධාතුවංශය
- 1942 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාග යට නියමිත ධාතුවංශය
- කකුසන්ධ තෙරණුවන් විසින් ලියන ලද සිංහල ධාතුවංශය
- ධාතුවංශය
- පූජ්‍යපාද කකුසන්ධ නම් බහුශ්‍රැත ස්වාමීන්ද්‍ර කෙනෙක් විසින් විරචිත ධාතුවංශය
- සිංහල ධාතුවංශය : සේරුවාවිල තිස්ස මහා විහාරවංශය : ශාස්ත්‍රීය සංස්කරණය හා පාලි ධාතුවංස සන්සන්දනයක් සහිත විචාරාත්මක අධ්‍යයනයක්
- සිතියම් සහිත ධාතුවංශය

**නම්රුවන්මල**

*Namruvanmala*

සවනසිරි පැරකුම්බා රජු : කෝට්ටේ

පියුම්මල නම් නිඝණ්ඩු කෘතිය ගී විරිතෙන් පද්‍යයට නගා රචිත කෘතියකි.

- රුවන් මල් නිඝණ්ඩුව
- රුවන් මල් නිඝණ්ඩුව හෙවත් නාමරත්න මාලාව

**නරේන්ද්‍ර චරිතාවලෝකන ප්‍රදීපිකාව**

*Narēndra Caritāvalōkana Pradīpikāva*

සිරිසුනන්ද මා හිමි, යටන්වල : නූතන යුගය (ක්‍රි.1834)

ඉංග්‍රීසි ආණ්ඩුවේ ආරාධනයෙන් මහාවංසයට අයත් කථා ප්‍රවෘත්ති සංක්ෂිප්ත කොට රචනා කර ඇති කෘතියකි. පාලි මහා වංසය අනුගමනය කරමින් ලියූ සංක්ෂිප්ත ඉතිහාසයක් ඇත. පරිච්ඡේද 88 කින් හෙබි එහි ලංකා ඉතිහාසයේ ආරම්භයෙහි පටන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අවසානය දක්වා සිංහල රාජවංස කතාව හා තත්කාලීන ප්‍රවෘත්ති ඇතුළත් ය.

**නිකාය සංග්‍රහය**

*Nikāya Saṅgrahaya*

ජයබාහු මා හිමි, සංඝරාජ ධර්මකීර්ති : ගම්පොළ

මුල පටන් කෘතිය රචිත යුගය දක්වා ලාංකීය ශාසනික ඉතිහාසය සංක්ෂේප කොට රචිත කෘතියකි.

- නිකාය සංග්‍රහ විවරණය
- නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය
- විවරණ සහිත නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය

**නීලකොබෝ සන්දෙශය**

*NīlakobōSandēśaya*

බරණ ගණිතාචාර්ය : මහනුවර

කතුවරයාට ඇති වූ චර්ම රෝගයකින් මිදීම සඳහා කතරගම දෙවිඳුන් වෙත නීලකොබෝ කුරුල්ලකු දූතයකු කොට සිටිනා මළුවේ සිට කතරගම දක්වා ගමන් මාර්ග කොට යැවෙන සේ රචිත කවි 148කින් යුත් සන්දේශ කාව්‍යයකි.

- කතරගම දෙවිඳුට සංදේශ කවි 1700 - 1900 : කහකුරුළු සංදේශය, නීලකොබෝ සංදේශය, කැට කිරිලි සංදේශය, දිය සැවුල් සංදේශය, මයූර සංදේශය, වටු සංදේශය
- බරණ ගණිතාචාර්යයන් විසින් විරචිත නීලකොබෝ සන්දේශය
- වර්ණනා සහිත නීලකොබෝ සන්දේශය

**පංචිකා ප්‍රදීපය**

*Pañcikā Pradīpaya*

රාහුල හිමි, තොටගමුවේ ශ්‍රී : කෝට්ටේ සමය

මොග්ගල්ලාන ව්‍යාකරණය ගුරුකොට ගනිමින් එහි පංචිකාවට සවිස්තර විභාගයක් ලෙස සියබසින් කළ කෘතියකි.

**පත්තිනි හෑල්ල**

*Patthini Hēlla*

—— : මහනුවර

පත්තිනි දේවතාවියගේ චරිතය වර්ණනා කරමින් යාදින්නක ස්වරූපයෙන් රචිත කාව්‍ය කෘතියකි.

- පත්තිනි හෑල්ල ශ්‍රී රාහුල හිමි ප්‍රණීත
- පලග සැහැල්ල හෙවත් පත්තිනි හෑල්ල
- පලග හෑල්ල හෙවත් පත්තිනි හෑල්ල
- සිරි පසිඳු සිද්ධ පත්තිනි දේව ස්තෝත්‍ර සහිත පුරාණ පත්තිනි හෑල්ල

**පන්සිය පනස් ජාතක පොත**

*Pansiya Panas Jātaka Pota*

—— : කුරුණෑගල

පාලි ජාතකට්ඨ කථාව ඇසුරෙන් සිංහලෙන් රචිත කෘතියයි. මෙය බහු කර්තෘ කෘතියක් ලෙසත් ඊට පෙර සංගෘහිතව පැවති ජාතකත් එකතු කොට සංස්කරණය වුණු කෘතියක් ලෙස පිළිගැනේ.

- ගුණ නැණ වඩන බෝසත් කතා : පන්සිය පනස් ජාතකය ඇසුරෙන්
- ජාතක කතා සංග්‍රහය
- ජාතකපාලිය, ජාතකට්ඨ කතා සහ පන්සිය පනස් ජාතක පොත
- ජාතක පොත : බුද්ධවංසය සහිත පන්සිය පනස් ජාතක පොත් වහන්සේ
- දශ ජාතක වස්තුව
- නිමි ජාතකය
- නුවණ වැඩෙන බෝසත් කතා -12 : ජාතක පොත් වහන්සේ හංස වර්ගය
- නුවණ වැඩෙන බෝසත් කතා - 1 : ජාතක පොත් වහන්සේ (අපණ්ණක වර්ගය)
- පන්සිය පනස් ජාතක කතා පොත : පළමු වෙනි වෙළුම
- පන්සිය පනස් ජාතක කතා පොත : සිව්වන වෙළුම
- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ : තුන්වන කාණ්ඩය
- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ : හතර කාණ්ඩය
- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ : පස්වන කාණ්ඩය
- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ : හයවන කාණ්ඩය
- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ : හත්වන කාණ්ඩය
- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ : දසවන කාණ්ඩය
- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ දහවන කාණ්ඩය : 538 උම්මග්ග ජාතකයේ සිට 539 වෙස්සන්තර ජාතකය අවසනට
- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ - Vol. 1 : අපණ්ණක ජාතකයේ සිට බන්ධනගර ජාතකය අවසානට)
- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ : සරල සංක්ෂිප්ත
- පන්සිය පනස් ජාතක පොත
- පන්සිය පනස් ජාතක පොත, 10 වන කාණ්ඩය : ජාතක කතා අංක 314-353
- පන්සිය පනස් ජාතක පොත, 11 වන කාණ්ඩය : ජාතක කතා අංක 354-396
- පන්සිය පනස් ජාතක පොත, 18 වන කාණ්ඩය : ජාතක කතා අංක 519-523
- පන්සිය පනස් ජාතක පොත, 19 වන කාණ්ඩය : ජාතක කතා අංක 524-528
- පන්සිය පනස් ජාතක පොත : කොටස්
- පන්සිය පනස් ජාතක පොත, පළමු කාණ්ඩය : සිතුවම් සහිත

- පන්සිය පනස් ජාතක පොත, දෙවැනි කාණ්ඩය : සිතුවම් සහිත
- පන්සිය පනස් ජාතක පොත : සංක්ෂිප්ත ජාතක පොත - 1
- පන්සිය පනස් ජාතක පොත - සිංහල ජාතක පොත : අපණ්ණක සීල කුරුන්ග කුලවකඅත්තකමවග්ග 1 - 50 දක්වා
- පන්සිය පනස් ජාතක පොත ("Jataka pathama pannasaka dipika" nam palamu jataka panasa ha ehi vivaranaya)
- පන්සිය පනස් ජාතක පොත : ජාතක පොත : වෙළුම 1 : බුද්ධවංසය සහිත පන්සිය පනස් ජාතක පොත
- පන්සිය පනස් ජාතක පොත : බුද්ධවංසය සහිත.Vol. 1. P i - 848 පන්සිය පනස් ජාතක පොත
- පන්සිය පනස් ජාතකය, ප්‍රථම කාණ්ඩයඃ විමර්ශනය හා ඌනපූර්ණ සහිත
- පන්සිය පනස් ජාතක පොත : ප්‍රථම භාගය, කතා 1 සිට 50, පන්සිය පනස් ජාතක පොත් වහන්සේ : සරල සංක්ෂිප්ත
- පන්සිය පනස් ජාතක පොත (වෙළුම. i) සම්මා සති : පන්සිය පනස් ජාතක පොතේ තේලපත්ත ජාතකය ඇසුරෙන්
- පන්සිය පනස් ජාතක පොත (වෙළුම. ii)
- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ : සිතුවම් සහිත
- පන්සිය පනස් ජාතක පොත - 4 : ශාස්ත්‍රීය සංස්කරණය
- පන්සිය පනස් ජාතක පොත - 2 : ශාස්ත්‍රීය සංස්කරණය
- පන්සිය පනස් ජාතක පොත - 3 : ශාස්ත්‍රීය සංස්කරණය
- පන්සිය පනස් ජාතක පොත - 1 : ශාස්ත්‍රීය සංස්කරණය
- පන්සිය පනස් ජාතක පොත : ශාස්ත්‍රීය සංස්කරණය
- පන්සිය පනස් ජාතක මහා කාව්‍යය ප්‍රථම කාණ්ඩය
- පන්සිය පනස් ජාතකය : 11 කොටසඃ භූරිදත්ත ජාතකයේ පටන් උම්මග්ග ජාතකයේ භූරි ප්‍රශ්නයේ අවසානය දක්වා
- පන්සිය පනස් ජාතකවලට ඇතුළත් මහා බෝධි ජාතකය
- පාඨශාලා හැරයෑමේ විභාගයට නියමිත භූරිදත්ත - වෙස්සන්තර ජාතක කතා
- පෙළ අටුවා සහිත උන්මදන්ති ජාතකය
- බෞද්ධ සාහිත්‍යයෙන් අසිරිමත් කතාඃ පන්සිය පනස් ජාතක පොත සහ දිව්‍යාවදානය ඇසුරිනි.
- බුද්ධවංශය සහිත පන්සිය පනස් ජාතක පොත් වහන්සේ 1 වන කොටස
- බුද්ධවංශය සහිත පන්සිය පනස් ජාතක පොත් වහන්සේ 3 වන කොටස : සිතියම් සහිතයි
- භූරිදත්ත - වෙස්සන්තර ජාතක විවරණය
- සන්න සහිත කුස ජාතකය
- විධුර ජාතකය : (537 වන ජාතක කතාව) පන්සිය පනස් ජාතක පොත

**පරංගි හටන**

*Parangi Hatana*

අලගියවන්න මුකවෙටි : සීතාවක

දෙවැනි රාජසිංහ රජු හා පෘතුගීසින් අතර ඇති වූ යුද්ධ පිළිබඳ විස්තර කරමින් කරන ලද පද්‍ය 214 කින් යුත් කාව්‍ය කෘතියකි.

- පරංගි හටන
- පරංගි හටනය හෙවත් දෙවනි රාජසිංහ රජු ප්‍රතිකාලුන් පරාජය කළ ආකාරය පිළිබඳ යුද්ධ වර්ණනාව
- විරහ කවි හටන් කවි හා ප්‍රශස්තිඃ වියොවගරත්නමාලය (පරංගි හටන හා කුස්තන්තිනූ හටන් පිළිබඳ තොරතුරු ඇතුළත්ය.)

## පරෙවි සන්දේශය

*Parevi Sandēśaya*

රාහුල හිමි, තොටගමුවේ ශ්‍රී : කෝට්ටේ

vi වන පැරකුම් රජුගේ දියණියට සුදුසු සැමියෙකුත් අනතුරු ව සුදුසු පුතෙකුත් ලබා දෙන ලෙස උපුල්වන් දෙවිඳුගෙන් ඉල්ලීම අරමුණු කොට කෝට්ටේ සිට දෙවිනුවර දක්වා ගමන් මාර්ග වර්ණිත ව රචිත සන්දේශ කාව්‍ය කෘතියකි.

- අභිනව පරෙවි සන්දේශය
- අශ්ලීල පද්‍ය විරහිත පරෙවි සන්දේශය
- අශ්ලීල පද්‍ය විරහිත විස්තර සන්න සහිත පරාපත සන්දේශය
- පදාර්ථ භාවාර්ථ විස්තර සන්න සහිත පරෙවි සන්දේශය
- පරෙවි සන්දේශ කාව්‍ය වර්ණනාව
- පරෙවි සන්දේශය
- පරෙවි සන්දේශය : පදගතාර්ථය විස්තර විමර්ශන සහිත
- පරෙවි සන්දේශය : පරෙවි සන්දේශ වර්ණනාව
- පරෙවි සන්දේශය : පරෙවි සන්දේශ විවරණය
- පරෙවි සන්දේශය පරෙවි සඳැස් පහදනය
- පරෙවි සන්දේශ විවරණය
- රහල් වැඩිතැන් වදහළ කල රැවු සඳෙස හෙවත් පරෙවි සන්දේශය
- විමර්ශන සහිත පරෙවි සන්දේශය
- ශ්‍රී රාහුල මා හිමියන්ගේ පරෙවි සන්දේශය
- සිරි රහල් පබඳ

## පැරකුම්බා සිරිත

